**ශීර්ෂය - 119 - විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරණ විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටුකිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 119 - විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.10 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු වී තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණ ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127(1) (අ) | නිවැරදි සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරු වන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. (දෙපාර්තමේන්තු කටයුතු සිදු කළ යුත්තේ හුදෙක් මූල්‍ය හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටුකිරීමේදී බලාපොරොත්තුවන අවංකභාවය පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූල බව) | 1. අධි ප්‍රතිපාදනය | 2.6 |
| | | 2. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.7 |
| 127(1) (ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අනුකූල නොවීම් | 2.8 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.9 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවට භාජනය කිරීම | ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් | 2.2 |

| | | | |
|---|---|---|---|
| 127 (3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම | වත්කම් කළමනාකරණයේ දුර්වලතා | 2.4 |
| 127 (5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | | 2.8(i) |
| 127 (7) | නිලධාරීන්ගේ/ සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/ සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේ නම් තමා වෙත පැවරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට , තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම. | මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.10 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---------------------------------------------

**2.1 කාර්යසාධනය**

---------------

**2.1.1 සැලසුම් කිරිම**

---------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 07 ක් පැවැති අතර, අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතන 09 ක හා විදේශ ව්‍යාපෘති 07 ක අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඉහත චක්‍රලේඛයට අනුව ක්‍රියාකාරී සැලැස්මෙහි අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය සහ වාර්ෂික අත්මුදල් සැළැස්ම ඇතුලත් කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් කාලානුරූපව සමාලෝචනය කර සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රගති වාර්තා සකස් කර නොතිබුණි.

### 2.1.2 කාර්යභාරයන් ඉටුනොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටුනොකිරීම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශය පහත සඳහන් ව්‍යාපෘති ඉටුකළ යුතුව තිබුණත්, එසේ ඉටුනොකිරීම හේතුවෙන් රු.මිලියන 31.5 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

| | ප්‍රධාන කාර්යභාරය | මූලායනය | සලසා තිබුණු ප්‍රතිපාදනය |
|---|---|---|---|
| | | | රු.මිලියන |
| I. | පිවිතුරු බලශක්තිය සහ ජාල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | ආසියානු සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකා රජය | 1 |
| II. | නවීන ජෛව බලශක්ති තාක්ෂණය හඳුන්වා දීම සහ ජෛව ස්කන්ධ බලශක්ති ප්‍රවර්ධනය | ශ්‍රී ලංකා රජය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | 15 |
| III. | ශ්‍රී ලංකාවේ බලශක්ති නිෂ්පාදනයේදී හා භාවිතයේදී විමෝචනය වන හරිතාගාර වායු අවම කිරීම සඳහා ජාතික වශයෙන් යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා යටිතල පහසුකම් සංවර්ධනය | ගෝලීය පරිසර අරමුදල, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | 5 |
| IV. | විදුලි සැපයුම් ස්ථායීතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය - යටිතල පහසුකම් සංවර්ධනය | ආසියානු සංවර්ධන බැංකුව | 10.5 |
| | **එකතුව** | | **31.5** |

### 2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක පීඑෆ්/402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2017 වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2018 අගෝස්තු 24 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.2** **විදේශ ආධාර ව්‍යාපෘති**

**-----------------------**

**ව්‍යාපෘතිය නියමිත දින ආරම්භ නොකිරීම**

**-----------------------------------------**

මෙගා වොට් 31 ක ධාරිතාවයක් ජාතික විදුලි ජාලය වෙත ලබාගැනීම සඳහා ක්‍රියාත්මක මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීමට අදාල ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කළ ද අවුරුදු 3 ක ප්‍රමාද කාලයෙන් පසුව මෙහි වැඩකටයුතු 2017 වර්ෂයේ දී ආරම්භ කර ඇත. ඒ සඳහා රු.මිලියන 16,780 ක මුදලක් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබී ඇති අතර 2017 වර්ෂය අවසාන වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 9 කි. මෙම ව්‍යාපෘතිය නියමිත දිනට ආරම්භ නොකිරීම හේතුවෙන් ලබාගත් ණය මුදල් වෙනුවෙන් රු.මිලියන 28කට ආසන්න මුදලක් (USD 177,931) දණ්ඩන ලෙස (Commitment Charges) ගෙවීමට සිදුව තිබුණි.

**2.3** **ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් සහ සේවා ලබා ගැනීම**

**-----------------------------------------------------------------**

**ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම**

**--------------------------------**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් සහ සේවා ලබා ගැනීම සඳහා රු.මිලියන 5.45 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර , ඉන් රු. මිලියන 1.3 ක් උපයෝජනය නොකර සම්පූර්ණයෙන්ම ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**2.4** **වත්කම් කළමනාකරණය**

**--------------------------**

(අ) **ඉන්ධන දහනය පරීක්ෂාව**

**----------------------------**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද අමාත්‍යාංශය ඊට අනුකූලව ක්‍රියාකර නොතිබුණි. ඊට අමතරව චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව වාහන සම්බන්ධයෙන් සටහනක් පවත්වා නොතිබුණි.

**(ආ)** **කාර්යාල පවත්වා ගැනීමේ වියදම්**

**-------------------------------------**

අමාත්‍යාංශය වාර්ෂිකව රු. 20,429,958 ක කුලියක් මත ලබාගත් ගොඩනැගිල්ලක කාර්යාලය පවත්වා ගෙන යනු ලබයි. වාර්ෂික පිරිසිදු කිරීමේ ගාස්තුව රු.2,924,719 ක් ද ඇතුළු මුළු ගොඩනැගිලි වෙනුවෙන් වූ වියදම රු. 23,354,677 ක් වී තිබුණි. ඒ අනුව ඒක පුද්ගල කාර්යාලය පවත්වා ගැනීමේ වියදම රු. 165,636 ක් වැනි ඉහළ අගයක් ගෙන තිබුණි.

**2.5** **කළමනාකරණ දුර්වලතා**

----------------------------

(i) අමාත්‍යාංශයේ සවිකර ඇති වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීම සහ අලුත් වැඩියා කිරීම 2008 වර්ෂයේ සිට 2016 දක්වා විධිමත් සේවා ගිවිසුමක් නොමැතිව ලංකා විදුලිබල මණ්ඩලයේ වායු සමීකරණ හා ශිතකරණ ශාඛාව මඟින් සිදුකර තිබුණි. ඒ සඳහා වාර්ෂික නඩත්තු ගාස්තු වශයෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට අමාත්‍යාංශයෙන් විදුලිබල මණ්ඩලයට රු.මිලියන

16 ක් ගෙවීමට ඇති බව ලංකා විදුලිබල මණ්ඩලයේ මුලා ප්‍රකාශන අනුව නිරීක්ෂණය විය. මෙම වියදම් නිරවුල් කිරීමට 2018 අගෝස්තු 24 දින දක්වා පියවර ගෙන නොතිබුණි.

(ii) සුහුරු විදුලි මනු දේශීයව නිෂ්පාදනය කර ශ්‍රී ලංකාවේ විදුලි බල ක්ෂේත්‍රයට හඳුන්වාදීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය හා පේරාදෙණිය විශ්ව විද්‍යාලය එක්ව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ඒ සඳහා රු.මිලියන 10.19 ක් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණත්, මණ්ඩලය විසින් එය අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර රඳවාගෙන තිබුණි.

## 2.6 කාර්යභාරයන් ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 5 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 1,087 | 710 | 377 | 35 |
| | මූලධන | 27,463 | 20,671 | 6,792 | 25 |
| | **එකතුව** | **28,550** | **21,361** | **7,169** | **25** |
| 2014 | පුනරාවර්තන | 184 | 180 | 4 | 2 |
| | මූලධන | 32,127 | 24,107 | 8,021 | 25 |
| | **එකතුව** | **32,311** | **24,287** | **8,025** | **25** |
| 2015 | පුනරාවර්තන | 368 | 332 | 36 | 10 |
| | මූලධන | 8,867 | 7,578 | 1,290 | 15 |
| | **එකතුව** | **9,235** | **7,910** | **1,326** | **14** |
| 2016 | පුනරාවර්තන | 509 | 477 | 32 | 6 |
| | මූලධන | 13,159 | 12,543 | 615 | 5 |
| | **එකතුව** | **13,668** | **13,020** | **647** | **5** |
| 2017 | පුනරාවර්තන | 453 | 442 | 11 | 2 |
| | මූලධන | 8,763 | 8,140 | 623 | 7 |
| | **එකතුව** | **9,216** | **8,582** | **634** | **7** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 14 ක් සඳහා එකතුව රු.මිලියන 802 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 228 ක් පමණක් උපයෝජනය කර තිබීම හේතුවෙන් ඉතිරිය, සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 90 ක් දක්වා පරාසයක විහිදී තිබුණි.

**2.7** **අග්‍රිම ගිණුම**

(අ) අමාත්‍යාංශය යටතේ වු අංක 7002/0000/00/0038/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 22.18 ක් විය. මෙය අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ කුලී තැන්පතුව වන අතර ගිවිසුම් කාලය අවසාන වන විට නිරවුල් වීමට නියමිතව ඇත.

(ආ) ලංකා විදුලිබල මණ්ඩලය මඟින් නියං කාලයේ දී ඉන්ධන භාවිතයෙන් විදුලිය ජනනය කිරීම වෙනුවෙන් අප්‍රේල් මාසයේ දී ඉල්ලුම් කරන ලද රු. මිලියන 3,000 ක් සඳහා අග්‍රිම එම මාසය තුල නොලැබුණ ද වර්ෂය අවසානයේ දී ඒ වෙනුවෙන් රු. මිලියන 6,000 ක් ලැබී තිබුණි.

(ඇ) රාජ්‍ය ආයතන තුල සූර්ය බලශක්ති පද්ධති සවිකිරීම හා ෂැංග්‍රිලා හෝටල් ව්‍යාපෘතියට විදුලිය ලබාදීම වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට නිරවුල් කළ යුතු මුදල් වෙනුවෙන් ඉල්ලුම් කරන ලද රු. මිලියන 475 ක අග්‍රිම සමාලෝචිත වර්ෂයේ දී භාණ්ඩාගාරය විසින් නිදහස් කර නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 12 කට අදාළව ලබා දී තිබුණු එකතුව රු. 223,963 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම, කාර්ය නිම වී මාස 01 සිට මාස 05 දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසු නිරවුල් කර තිබුණි.

**2.8** **නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

(අ) අංක CA/1/17/1 දරන 2010 මැයි 14 දිනැති ජනාධිපති කාර්යාලයීය රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම නිල වාහන ප්‍රමාණය 03 ක් වුවද ඊට අනුකූල නොවන පරිදි අමාත්‍යවරයා 2016 අගෝස්තු 25 දින සිට වාහන 04 ක් පරිහරණය කර තිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යවරයා හා නියෝජ්‍ය අමාත්‍යවරයා සඳහා අනුමත උපරිම කාර්ය මණ්ඩලය 15 ක් වුවද අමාත්‍යවරයාගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයාගේ අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව පිළිවෙලින් නිලධාරීන් 06 ක් සහ නිලධාරීන් 02 ක් යොදවා තිබුණි. ඒ සඳහා 2017 වර්ෂයේදී රු. 7,226,299 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ඇ) ඉහත චක්‍රලේඛයේ 5.3 ඡේදයේ දක්වා ඇති පරිදි අමාත්‍යවරයාගේ ජංගම දුරකථනය සඳහා මාසික උපරිම සීමාවන් ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී රු.97,130 ක් වැඩියෙන් වියදම් කර තිබුණි.

**2.9** **මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගලික පඩිනඩි සඳහා වියදම**

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 78 ක් වැය කර තිබුණි. ඒ අනුව, ඒක පුද්ගල වියදම රු. මිලියන 0.74 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 17 | 13 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 72 | 49 | 23 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 46 | 41 | 05 |
| (v) | අනියම්/ කොන්ත්‍රාත් | 02 | 01 | 01 |
| | **එකතුව** | **141** | **105** | **36** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

2017 වර්ෂය තුල කිසිම ආකාරයේ පුහුණුවක් ලබා නොතිබුණු නිලධාරීන් ගණන 42 ක් වූ අතර එය මුළු තථ්‍ය කාර්ය මණ්ඩලයෙන් සියයට 30 ක ප්‍රමාණයකි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී කාර්ය මණ්ඩල පුහුණුවීම් සඳහා රු.මිලියන 2 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර එයින් රු.මිලියන 0.774 ක් එනම් සියයට 39 ක් උපයෝජනය කර නොතිබුණි. තවද, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 0.33 ක් ප්‍රතිපාදනය කර තිබුණ නමුත් රාජ්‍ය භාෂා කමිටු පත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

| | සේවක වර්ගය | සංඛ්‍යාව | කාල පරිච්ඡේදය | වෙනත් පාර්ශවය |
|---|---|---|---|---|
| i. | පාලන සම්බන්ධීකාරක | 2 | 2015-05-18 දින හා 2015-10-21 දින සිට | ලංකා විදුලිබල මණ්ඩලය |
| ii. | යතුරු ලේඛිකා | 1 | 2015-11-27 දින සිට | ලංකා විදුලිබල මණ්ඩලය |
| iii. | පුහුණුවන කණිෂ්ඨ කාර්මික සහයක | 1 | 2015-11-02 දින සිට | ලංකා විදුලිබල මණ්ඩලය |
| iv. | රියදුරු | 2 | 2017-02-06 දින හා 2017-06-22 දින සිට | ශ්‍රී ලංකා මහ බැංකුව |
| v. | රියදුරු | 1 | 2015-11-23 දින සිට | ලංකා විදුලිබල මණ්ඩලය |
| vi. | මැනුම් ක්ෂේත්‍ර සහායක | 1 | 2016 -04-01 දින සිට | මිනුම්දෝරු දෙපාර්තමේන්තුව |
| | | **8** | | |

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(i) 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාලීය රජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛයේ 2.2 ඡේදය ප්‍රකාරව ගරු අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා රජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනයක නිළධාරියෙකු අනුයුක්ත කරගන්නේ නම් ඔහුට ගෙවිය යුත්තේ ඔහු එම ආයතනයේ ලබමින් සිටිය වැටුප නොව අනුයුක්ත කරන ලද තනතුරට අදාල වැටුප් වේ . නමුත් අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇති බාහිර ආයතන වල නිලධාරීන්ට ඔවුන් සේවය කළ ආයතනයේ ලබමින් සිටි වැටුප් ගෙවා තිබුණි.

(ii) අමාත්‍යාංශයේ සේවයේ යෙදවූ ලංකා විදුලි බල මණ්ඩලයේ සේවකයන් 07 දෙනෙකු සඳහා හා ශ්‍රී ලංකා මහ බැංකුවේ රියදුරෙකු සඳහා වැටුප් පිළිවෙලින් රු.7,037,271 ක් හා රු.1,437,940 ක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රතිපුරණය කර තිබූ අතර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිළධාරියා වෙනුවෙන් රු.384,120 ක වැටුප් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ රියදුරු සඳහා දෙසැම්බර් මස වැටුප වන රු. 167,392 ක මුදල අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් ගෙවා තිබුණි.

**2.10 රජයේ නිලධාරින්ගේ ඇප තැබීම**

---------------------------------

මුදල් රෙගුලාසි 880 හි විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශයේ ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි.